# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.29 පැය 1010 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 2135 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ඇති වී තිබෙන හදිසි ආපදා තත්ත්වය සම්බන්ධව තොරුතුරු දැනුම් දීම සඳහා පොලිස්පති විශේෂ මෙහෙයුම් මැදිරියක් ආරම්භ කිරීම**

දිවයිනට බලපා ඇති හදිසි අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් බොහෝ ප්‍රදේශවල අධික වැසි, ගංවතුර, තද සුළං හා නායයෑම් තත්ත්වයන් ඇති වී ඇති අතර, ඇතැම් ප්‍රදේශ වලින් මහජනතාවට ඉවත්වීමේ නිවේදන ද නිකුත් කිරීමට මේ වන විට කටයුතු කර ඇත.

උද්ගතවී ඇති මෙම හදිසි තත්ත්වය පිළිබඳ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සඳහා සහ අවශ්‍ය සහන සැලසීමට පොලිස්පතිතුමාගේ අධීක්ෂණය යටතේ පොලිස්පති විශේෂ මෙහෙයුම් මැදිරියක් පොලිස් මූලස්ථානයේ ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.

| දුරකථන අංක | Whats App දුරකථන අංක | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|
| 011 - 2013051 | 071 - 8595884 | Igp.opsroom@police.gov.lk |
| 011 - 2027148 | 071 - 8595883 | |
| 011 - 2027149 | 071 - 8595882 | |
| 011 - 2472757 | 071 - 8595881 | |
| 011 - 2430912 | 071 - 8595880 | |

එසේම සියලු පොලිස් බල ප්‍රදේශයන් හී ඇති වන අපදා තත්ත්වයන් වලට මුහුණදීම සඳහා පොලිස් නිලධාරීන් කණ්ඩායම් වශයෙන් පොලිස් ස්ථාන වල සූදානම් කර ඇති අතර, කෙටි දැනුම් දීමකදී ක්‍රියා කිරීමට හැකිවන පරිදි බෝට්ටු, කිමිදුම්කරුවන් ඇතුළු ආපදා උපකරණ ද සූදානම් කර ඇත.

එසේම මෙම අපදා තත්ත්වයන් වලට මුහුණ දීමට මෙන්ම මහජන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අපදාකළමණාකරණ මධ්‍යස්ථානය, ත්‍රිවිධ හමුදා ඇතුළු අනෙකුත් අදාළ ආයතන වල බලධාරීන් සම්බන්ධකර ගැනීම සිදු කර ඇත.

පොලිසිය විසින් අවතැන් වූ තැනැත්තන්ගේ නිවාස හා දේපළ ආරක්ෂා කිරීමට සුදුසු වැඩපිළිවලක්ද සෑම පොලිස් වසමකම ක්‍රියාත්මක කර ඇති අතර, ආරක්ෂිත ස්ථානවල රැඳී සිටින අවතැන් වූ පිරිස් වෙත අවශ්‍ය ආරක්ෂාව හා සුබසාධන පහසුකම් සැලසීමටද කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා පොලිසිය ත්‍රිවිධ හමුදාව ආපදා කළමණාකරන මධ්‍යස්ථාන නිලධාරීන් සමග ආපදාවන්ට ලක්වූවන් බේරා ගැනීම, සහන සැලසීම, එම ප්‍රදේශ වල ආරක්ෂාව සැලසීම ආදී කටයුතු කලමණාකරනය කර සිදු කර ගැනිමට ආවශ්‍ය සහාය ලබා දෙන මෙන් ශ්‍රී

ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර, අවදානම් ස්ථාන වලට යාම, ආපදා ස්ථාන නැරඹීමට යාම, ජලයෙන් යට වී ඇති මාර්ග ඔස්සේ අනාරක්ෂිත ලෙස වාහන ධාවනය කිරීම ඇතුළු අපරික්ෂාකාරී කටයුතු වල නොයෙලෙන ලෙසටත් ශ්‍රී ලංකා පොලිසිය තවදුරටත් මහජනතාව දැනුවත් කර සිටී

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**